# ශ්‍රී ලංකාවේ ආරාමික පුස්තකාල ඉතිහාසය : අනුරාධපුර යුගය (ඓතිහාසික තොරතුරු ඇසුරෙනි)

**බෝදාගම සුමන හිමි**

## හැඳින්වීම

ශ්‍රී ලංකා පුස්තකාල ඉතිහාසයේ මූලාරම්භය සිදුවන්නේ මහින්දාගමනයෙන් පසුවය. ප්‍රාග් මහින්ද යුගයේ දී ලේඛනයන් පිළිබඳ විධිමත් සාධක හමු නොවීමත්, මිහිඳු හිමියන්ගේ ආගමනයත් සමඟ නව අක්‍ෂර කලාවක් මෙරටට හඳුන්වාදීමත්, හමු වූ සාධක පශ්චාත් කාලීන වීමත් යන කරුණු නිසා හෙළ පොත් ගුල් ඉතිහාසයේ ආරම්භය මෙම යුගයේ දී සිදු ව ඇති බව පෙනේ. දැනට මෙරට සොයා ගෙන ඇති පැරණිම ලේඛන මාධ්‍යය සෙල් ලිපි වන අතර, මිහින්තලා හා වෙස්සගිරි ලෙන් ලිපි දැනට හමුව ඇති පැරණිම ලේඛන ස්වරූප වේ. විධිමත් අක්‍ෂර කලාවක මුල් බැස ගැනීමත් සමඟම ලේඛන මාධ්‍යයන් බිහිවීම සාමාන්‍ය සිරිතය. මෙයට ප්‍රධානම හේතුවක් වූයේ මහින්දාගමනයත් සමඟම ලක්වාසීන්ට අක්‍ෂර මාලාවක් ලැබීමයි.



මහින්දාගමනයත් සමඟම අපට ලැබුණු 64 ක් කලාවන් අතර අක්‍ෂර කලාවක් ද අන්තර්ගත වීම හෙළ සාහිත්‍යයක නව දොරගුළු විවර කරන්නක් විය. අක්‍ෂර කලාවක් නිසා භාෂාවක් ද, භාෂාව නිසා ලේඛන සම්ප්‍රදායක් ද, ලේඛන සම්ප්‍රදාය නිසා දියුණු සාහිත්‍යයක් ඇති වූ මෙරටෙහි අද්විතීය පොත්ගුල් සමූහයක් ඇති වූ අයුරු ඉතිහාසය විමසීමෙන් දැක ගත හැකිය.

## අනුරාධපුර යුගයේ පොත් ගුල් කලාවේ ආරම්භය හා සංවර්ධනය

අනුරාධපුර යුගය හෙළ ඉතිහාසයේ මෙන්ම පොත් ගුල් කලාවේ ද ආරම්භක යුගයයි. මෙම යුගයේ ලේඛන මාධ්‍යයන් වූයේ ශිලා, තඹ, රන්, රිදී, වැටකේ පත් හා පුස්කොළ පොත්ය. මුල් කාලීනව ගිරි ලිපි හා සෙල් ලිපිවල ලෙන්, ගුහා හා ආරාම පූජා කිරීම් පිළිබඳ තොරතුරු අන්තර්ගත විය. මෙම සෙල් ලිපි, ගිරි ලිපි හා වැම් ලිපි මගින් මුල් කාලීන ලේඛන මාධ්‍ය, ලේඛන රීතිය පිළිබඳ මනා අවබෝධයක් ලබා ගත හැකිය. මිහින්තලේ ගල්ලෙන් ආශ්‍රිතව පිහිටුවා ඇති ශිලා ලේඛනවලින් ද එය මනාව පිළිබිඹු වේ. මෙම සෙල්ලිපි බොහෝමයක "අගත අනගත චතුදිස සගස දිනෙ" යනුවෙන් සඳහන් වන අතර මෙතුළින් මිහිඳු හිමි ඇතුළු 68 නමක් උදෙසා පූජා කළ ලෙන් පිළිබඳ විස්තර ඇතුළත් වේ. මහින්දාගමනයට පසුව මෙරට විසූ රජවරුන් හා ඉන්දිය රජවරුන් අතර සිදු වූ ලිපි හුවමාරු පිළිබඳ

වංසකථාන්හි තොරතුරු දක්වේ. මිහිඳු මාහිමියන්ගේ උපදෙස් මත දෙවානම් පියතිස්ස රජු අරිට්ඨ කුමරු අත අශෝක රජතුමා වෙත හසුන් පතක් යැවීමේ පුවතක් මහාවංශයේ දක්වේ. එම හසුනේ මෙහෙණි සස්න පිහිටුවීම පිළිබඳ හා විජය ශ්‍රී ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ ශාඛාවක් මෙරටට වඩමවා ගැනීම පිළිබඳ කළ ඉල්ලීමක් ඇතුළත්ය. පශ්චාත් කාලීනවත් දෙරටෙහි රාජ්‍ය පාලකයන් රාජ තාන්ත්‍රීය ලිපි හුවමාරු වූ කර ගත් බවක් වංසකථා ආදියෙහි දක්වේ.[1] වසභ රජු දවස ( ක්‍රි. ව 66 - 110 ) යාපනයේ වල්ලිපුරම් ප්‍රදේශයෙන් හමු වූ රන් සන්නස ඓතිහාසික තොරතුරු අනාවරණය කරනු ලබන වැදගත් ලේඛනයකි. මීට අමතරව කැලණිතිස්ස රජතුමා විසින් තෙර නමක් තෙල් කටාරමක දමා ඝාතනය කිරීමෙන් සිදු වූ විනාශය වළක්වා ගැනීමට දේවී නම් තම දියණිය යාත්‍රාවක නංවා මුහුදේ පා කර හැරීමේ දී ඇය රාජ දියණියක් බව සටහන් රන් පතක් ද එහි තැන්පත් කළ බවක් මහාවංශයේ දක්වේ.[2] මෑතකදී ජේතවනයේ සිදු කළ කැනීම්වලදී රන්පතක් හමු වූ අතර එම රන්පතෙහි දහම් කරුණු අන්තර්ගත වීමෙන් එකළ නිධන් වස්තු ලෙස ධර්මපාඨ සහිත රන්පත් තැන්පත් කළ බවක් පෙනේ. මෙකී සාධක අධ්‍යයනය කිරීමෙන් මෙරට දියුණු ලේඛන කලාවක් වූ බවට නිගමනය කළ හැකිය.

## ආරාමික පුස්තකාල : මහාවිහාර පුස්තකාලය

මහින්දාගමනයෙන් පසුව මෙරටෙහි ආරාමික අධ්‍යාපන ක්‍රමවේදය ආරම්භ විය.[3] අරිට්ඨ කුමරුගෙන් ඇරඹි



ලාංකීය භික්ෂු පරපුරේ අධ්‍යාපන මධ්‍යස්ථානය වූයේ කාලප්‍රසාද නම් පරිවෙණස්ථානය බව ඉතිහාසගත තොරතුරු අනුව නිශ්චය කර ගත හැකිය. එසේම මහා විහාරය කේන්ද්‍ර කොට පැවැති පිරිවෙන පැරණි ලංකාවේ ශ්‍රේෂ්ඨතම අධ්‍යාපන පීඨයක් ලෙස බොහෝ දෙනාගේ පිළිගැනීම වේ. මෙම අධ්‍යාපන පීඨය ඉන්දියාවේ නාලන්දා, තක්ෂිලා විද්‍යා පීඨ හා සමාන විය. ක්‍රි. පූ. 3 වන සියවසේ ආරම්භ වූ මහාවිහාරය තුළ නේවාසික අධ්‍යාපන ක්‍රමයක් පැවති අතර මෙහි භික්ෂූන් වහන්සේලා 3000 ක් පමණ වාසය කර ඇත.[4] මෙහි පාලි ත්‍රිපිටකය සහ එයට අයත් වන ථෙරවාදී කතා අන්තර්ගත පොත් තිබී ඇත. හත්ථාල්හක ආරාමික මෙහෙණිවරුන් ද මහාවිහාරයෙහි වූ ග්‍රන්ථ පරිශීලනය කර ඇත. ඒ බව දීපවංශයේ,

**"ශ්‍රී සද්ධර්මයාගේ චිරස්ථිය කැමතියෝ වූ ඒ සියළු තෙරණිහු අනුරාධපුරයේ මහාවිහාරයෙහි විනය ග්‍රන්ථ පස ද අභිධර්මයේ සප්ත ප්‍රකරණයන් ද ඉගැන්වූවෝ"**[5]

යැයි සඳහන් කර දක්වීමෙන් දියුණු පුස්තකාල පද්ධතියක් මහාවිහාරය කේන්ද්‍ර කොට තිබූ බවට මෙයින් අනුමාන කළ හැකිය. මහාවිහාර පුස්තකාලය පරිශීලනය කළේ මෙරට පිරිස් පමණක් නොව බුද්ධඝෝෂ, බුද්ධදත්ත වැනි විදේශීය පිරිස් ද ඒ අතරට අයත්ය. මහානාම රජු දවස හෙළ අටුවා පාලියට පෙරළීමට බුද්ධඝෝෂ හිමියන්ට මෙම පුස්තකාලය පරිශීලනය කිරීමට ඉඩ සලසා දී ඇත. මහාවංශයෙහි එම පුවත දක්වා ඇත්තේ මෙසේය.[6]

"සීහලට්ඨ කථං සුත්වා ථෙරවාදස්ස සබ්බසො
ධම්මසාමිස්ස එසෝව අධිප්පායෝතීතිච්චිය
තත්ථ සංඝ සමානෙත්වා කාතුමට්ඨ කථං මම
පොත්ථකෙ දෙථ සබ්බේති ආහ වීමසිතුං සතං
සංඝො ගාථාද්වයං තස්සාදාසී සමත්ථීයං තව
එත්ථ දස්සොසී තං දිස්වා සබ්බේ දෙමාති
පොත්ථකෙ"

බුද්ධඝෝෂ හිමියන් පාලි අටුවාකරණය සඳහා මහාවිහාර පුස්තකාලයේ තැන්පත් සීහළ අට්ඨකතා ඉල්ලූ බව මහාවංශයේ දැක්වේ. තව ද ඊ. ඩබ්ලිව් අදිකාරම් මහතා දක්වන පරිදි බුද්ධඝෝෂ, බුද්ධදත්ත සහ මහානාම යන හිමිවරුන්ගේ පාළි අට්ඨකතාකරණය සඳහා මූලාශ්‍ර කරගන්නට ඇතැයි සැළකෙන ග්‍රන්ථ කිහිපයක් පැරණි ලක්දිව බෞද්ධ ඉතිහාසය පොතේ දැක්වේ[7].

01. මහා අට්ඨකථා හෙවත් මූලට්ඨකථා
02. උත්තර විහාරට්ඨකථා
03. මහාපච්චරියට්ඨකතා
04. කුරුන්දි අට්ඨකතා
05. අන්ධට්ඨකතා
06. සංඛේපට්ඨකතා
07. පොරාණට්ඨකතා
08. පුබ්බෝපදේසට්ඨකතා
09. විනයට්ඨකතා
10. සුත්තන්තට්ඨකතා



11. අභිධම්මට්ඨකතා
12. සීහළ මාතිකට්ඨකතා
13. දීඝට්ඨකතා
14. මජ්ඣිමට්ඨකතා
15. සංයුක්තට්ඨකතා
16. අංගුත්තරට්ඨකතා
17. ජාතකට්ඨකතා
18. විභඞ්ගප්පකරණස්ස සීහළට්ඨකතා

මේ අනුව මහාවිහාර පුස්තකාලය සතුව සිහළ අට්ඨකතා රාශියක් වූ බව අනුමාන කළ හැකිය. එසේ ම බුරුම පාලි ග්‍රන්ථයක් වන "බුද්ධඝෝෂුප්පත්තියෙහි" සිංහලෙන් ලියන ලද අටුවා පොත් ගොඩ ගැසූ කළ මධ්‍යම ප්‍රමාණයේ ඇතුන් සත් දෙනෙකුගේ පමණ උස ඇති බව දක්වා ඇති අතර මෙම කතා පුවතින් ද පැහැදිලි වන්නේ පාලි අට්ඨකතාකරණයට පෙර විශාල ග්‍රන්ථ එකතුවක් මෙහි තිබූ බවයි.[8] එකී මූලාශ්‍රයන් පදනම් කරගනිමින් බුද්ධඝෝෂ හිමියන් විසින් රචිත කෘති මෙසේ දැක්විය හැකිය[9].

01. විශුද්ධි මාර්ගය
02. සමන්තපාසාදිකා (විනය අටුවාව)
03. කඞ්ඛාවිතරණී (පාතිමොක්ඛ අටුවාව)
04. සුමංගලවිලාසිනී ( දීඝ නිකාය අටුවාව)
05. පපඤ්චසූදනී (මජ්ඣිම නිකාය අටුවාව)
06. සාරත්ථප්පකාසිනී (සංයුක්ත නිකාය අටුවාව)

11 NOV 2017

07. මනෝරථපූරණී (අංගුත්තර නිකාය අටුවාව)
08. ධම්මපදට්ඨකථා (ධම්මපද අටුවාව)
09. පරමත්ථජෝතිකා (සුත්ත නිපාත අටුවාව)
10. ජාතක අට්ඨකතා (ජාතක අටුවාව)
11. අත්ථසාලනි (ධම්මසඞ්ගනි අටුවාව)
12. සම්මොනවේදනි (විභඞ්ග අටුවාව)
13. පඤ්චප්පකරණට්ඨ (කථාවත්ථු, ධාතුකථා, යමක, පට්ඨාන පිළිබඳ අටුවාව)

යනාදී ශ්‍රේෂ්ඨ කෘති රචනා කළ බුද්ධඝෝෂ හිමි තම කෘති සඳහා අවශ්‍ය කරන දැනුම සපයා ගෙන ඇත්තේ මහාවිහාර පොත්ගුලෙනි. මේ සඳහා මහාඅට්ඨකතා, කුරුන්දි අට්ඨකතා, සඞ්ඛෙපට්ඨකතා, අන්ධට්ඨකතා, පච්චරිය අට්ඨකතා යන සිහළ අට්ඨකතා අශ්‍රය කරගෙන ඇති අතර උන්වහන්සේ විසූ ග්‍රන්ථාකාර විහාරය පොත්ගුලක් සහිත ආරාමයක් විය හැකිය. එයට හේතුව එහි පොත් ආකරය යන තේරුම එහි ගැබ්ව ඇති නිසාය. මෙම කාල වකවානුව වන විට මෙරට ප්‍රධාන ලේඛන මාධ්‍යය බවට පුස්කොළ පත් පත්ව ඇත.

බුද්ධදත්ත හිමියන් ග්‍රන්ථකරණය සඳහා මෙරටට පැමිණි පළමු විදේශීය භික්ෂුව වන අතර බුද්ධඝොසුප්පත්ති කථාවෙහි බුද්ධඝෝෂ හිමියන් ලංකාවට පැමිණෙන විට මුහුද මැද දී ලංකාවේ සිට තම රට බලා යන බුද්ධදත්ත හිමි මුණ ගැසුණු බව දක්වා ඇත. බුද්ධදත්ත හිමි විසින් රචිත කෘති පහතින් දැක්වේ[10].



01. අභිධම්මාවතාරය
02. මධුරත්ථවිලාසිනි (බුද්ධවංශ අටුවාව)
03. ජිනාලංකාරය
04. විනය විනිච්ඡය
05. රූපාරූප විභාගය
06. උත්තර විනිච්ඡය

බුද්ධදත්ත හිමි විසින් ඉහතින් දක්වා ඇති ග්‍රන්ථ රචනා කර ඇති බව වංශකථාවන්හි සඳහන් වේ. මහාවිහාරික භික්ෂූන් විසින් තම පාරිවෙණික අධ්‍යාපනය සඳහා බුද්ධදත්ත හිමියන්ගේ පොත් භාවිත කරන්නට ඇති බව බොහෝ විද්වතුන්ගේ අදහස වේ.

එසේම ධම්මපාල හිමියන්ද චෝළ රටින් මෙරටට පැමිණි තවත් උගතෙකි. හෙතම **පරමත්ථදීපනී** යනුවෙන් හැඳින්වෙන ඛුද්දක නිකායේ ඌන පූර්ණ කොටස, **ඉතිවුත්තක, විමානවත්ථු, ථෙර ගාථා, ථෙරී ගාථා, චරියා පිටක** ආදී කෘති ද විසුද්ධිමාර්ගයට **පරමත්ථ මඤ්ජුසාව** නම් අටුවාව ද, **ජාතකට්ඨ කතාවට** අටුවාවක් සම්පාදනය කර ඇත.[11]

මේ අනුව මෙරටට පැමිණි විදේශීය උගතුන් වන බුද්ධඝෝෂ, බුද්ධදත්ත, ධම්මපාල යන හිමිවරු අට්ඨකතාකරණයෙහි නියළුණු අතර ඔවුන් විසින් රචනා කරන ලද අටුවා ග්‍රන්ථ, සීහළට්ඨකතා හා අනෙකුත්

පොත්වලින් මහාවිහාර පුස්තකාලය හා තදනුබද්ධ අනෙකුත් පුස්තකාල පෝෂණය විය.

## අභයගිරිය පුස්තකාලය

අනුරාධපුර යුගයේ දී ඇති වූ නිකාය භේදයේ එක් ප්‍රතිඵලයක් ලෙස අභයගිරි හා ජේතවන විද්‍යාපීඨ ආරම්භ විය. මහායානික බුදු දහමේ ආභාසය ද ලැබූ අභයගිරියෙහි භික්ෂූන් පන්දහසක් පමණ එදවස වාසය කර ඇති බව ෆාහියන් භික්ෂුවගේ දේශාටන වාර්තාවල සඳහන්ය.[12] එසේම **කපාරමූළ, වහදූමූළ, උතුරුමූළ හා මහනෙත්පාමූළ** යන මූලායතනවලින් අභයගිරිය සමන්විත වූ අතර අධ්‍යාපනික වශයෙන් දෙස් විදෙස්හි ප්‍රචලිත ආයතනයක් ද විය. අභයගිරි පුස්තකාලයෙහි ථෙරවාදී ග්‍රන්ථ පමණක් නොව මහායාන බුදුදහමේ ග්‍රන්ථ ද තිබෙන්නට ඇති බව මිහින්තලේ ඉදිකටු සෑයෙන් මහායාන සූත්‍ර අඩංගු තඹ තහඩු හමුවීමත්, මිහින්තලේ ආරාධනා ගලේ කොටා ඇති ත්‍රිකායන්ට කළ නමස්කාර පිළිබඳ සඳහන්වීමත් යන කරුණු නිසා අනුමාන කළ හැකිය. අභයගිරි පුස්තකාලයෙහි උත්තරවිහාරට්ඨකතා, උත්තරවිහාරවාසීන්ගේ අටුවාව හා උත්තරවිහාර වංශය ද, වෛතුල්‍යවාදය, වාජිරවාදය ආදී වාද ග්‍රන්ථ තිබී ඇත.[13] මීට අමතරව දඹදිව පැවැත් වූ හතරවන ධර්ම සංගායනාවෙන් පසුව මහායාන සූත්‍ර නමයක් ලියා ඇත. එනම් ප්‍රඥා පාරමිතා, සද්ධර්මපුණ්ඩරීක, ලලිත විස්තරය, ලංකාවතාර සූත්‍රය, ස්වරණප්‍රභාස, ගණ්ඩව්‍යුහ, තථාගත ගුහ්‍යක, සමාධි රාජ හා දශභූමිෂ්වර[14] යනුවෙන් හැඳින්වෙන අතර මෙකී



ග්‍රන්ථ අභයගිරි පුස්තකාලයේ තැන්පත්ව තිබෙන්නට ඇති බවට නොයෙක් සාධක හමු වේ. අග්ගබෝධි රාජ සමයෙහි අමෝඝවජ්‍ර හිමියන් ඉන්දියාවෙන් හා මෙරටින් වජ්‍රයාන සූත්‍ර ඇතුළත් මහායාන ග්‍රන්ථ පන්සීයයක් පමණ චීනයට ගෙන ගිය[15] බව සඳහන් වෙන අතර මෙයින් ද පැහැදිලි වන්නේ විශාල පොත් එකතුවක් අභයගිරි පුස්තකාලයෙහි වූ බවයි.

## ජේතවනය පුස්තකාලය

මහසෙන් (ක්‍රි.ව 276 - 303) රජු විසින් ඉදිකළ ජේතවනාරාමය තවත් එක් ප්‍රධාන අධ්‍යාපනික මධ්‍යස්ථානයකි. සෙනෙවිරද් මූලය, දක්ඛිණ මූලය වැනි මූලායතනයනගෙන් හා ලහසිකා, හුණාලා ආදී රට පුරා වූ අධ්‍යාපනික ආරාමික ආයතනයන්ගෙන් යුක්ත වූ ජේතවන පාර්ශවය නිසා මෙරට පුස්තකාල ක්ෂේත්‍රය වඩාත් දියුණු ස්වරූපයක් ගත්තේය. ජේතවනාරාමය මහායාන බුදු දහමට නැඹුරුතාවක් දක්වූ නිසා මහායානික ග්‍රන්ථවලින් ද සමන්විත පොත්ගුලක් වූ බවට සාගලතිස්ස හිමියන් ආගම පිළිබඳ ලියන ලද ව්‍යාඛ්‍යාන සමූහයක් ද මෙම පුස්තකාලයෙහි තිබීමෙන් තහවුරු වේ.[16] ජේතවන භූමියෙන් හමු වූ සෙල්ලිපි කඩෙන් හා ජේතවනාරාමයෙන් හමු වූ ප්‍රඥාපාරමිතා සූත්‍රය ලියූ රන්පත්වලින් ද වෛතුල්‍යවාදයට අයත් බොහෝ පොත් පත් තිබූ බව සඳහන්ය.[17] චූල වංශයට අනුව ජේතවන විහාරයේ පොත් තැබීම සඳහා පුස්තකාලයක් හා මන්දිර 2 ක් තිබූ බවට සඳහන් වේ.

## අෂ්ට මූලායතන

අනුරාධපුර යුගයෙහි මහාවිහාරය, අභයගිරිය හා ජේතවනය කේන්ද්‍රකරගනිමින් ආරම්භ වූ අධ්‍යාපනික මූලායතන මෙසේය. මෙහි "මූල" යන්නෙහි තේරුම (සමූළ්හ, සමුළු, හමුළු, මුළු, මුළ) හැම පසින් එක්රැස් වූ පිරිස යනුයි. "මුළ සඟුන් ", "දෙමුළ සඟ තැනින් දෙමුළ බජ් තුවාක් අවසට" (කසුප් V රජුගේ අභයගිරි ලිපිය)[18] "දෙමුළ බද් වල්වලැ" (උයද IV රජුගේ බදුලු ලිපිය)[19] යන සෙල්ලිපි පාඨවල "මූළ" නමින් අභිප්‍රේත වූයේ මෙබඳු භික්ෂු සමූහ විය හැකිය. මෙහි "දෙමුළ" නම් ග්‍රාමවාසී හා අරණ්‍යවාසී නිකාය දෙක නියෝජනය කළ භික්ෂු පිරිස විය හැකිය. අනුරාධපුර යුගයෙහි ඇරඹි අෂ්ටමූලායතන මෙසේය.

| මූලායතන | |
|---|---|
| ගලතුරු මූලායතනය (සෙලන්තරමූළ)<br>විල්ගම් මූලායතනය (සරෝගාමූළ)<br>කපරා මූලායතනය | මහා විහාරය |
| වාදුම්මල මූලායතනය<br>උත්තර මූලායතනය<br>මහනෙත් මූලායතනය | අභයගිරිය |
| දක්ෂිණ මූලායතනය<br>සෙනෙවිරද් මූලායතනය | ජේතනය |



මෙම මූලායතනයන්ට අමතර පැවැති තවත් පිරිවෙන් කිහිපයක් සීගිරි ගීවල අන්තර්ගතව ඇති බව අබයරත්න අදිකාරි මහතා සම්භාව්‍ය භික්ෂු අධයාපනය හා අධ්‍යාපන නීති යන කෘතියෙහි දක්වා ඇත.

01. සීගිරි පද්‍ය 506 හි අලතුවැටි පිරිවෙන
02. එම 189 හි මාතා පිරිවෙන
03. එම 454 හි සලගල පිරිවෙන
04. එම 802 හි කබල්නාපා පිරිවෙන
05. එම 529 හි වෙහෙල්තරු පිරිවෙන
06. එම 552 හි වනගල පිරිවෙන
07. එම 254 හි මනාපව් පිරිවෙන
08. එම 275 හි තලපා පිරිවෙන[20]

අනුරාධපුර යුගයෙහි දිවයින පුරා තෙවළා දහම, අටුවා ටීකා ආදිය අධ්‍යයනය සඳහා ආරාමික අධ්‍යාපනික ස්ථානයන් වූ බවත් එකී ආයතනයන්හි මූලාශ්‍ර ග්‍රන්ථ ද වූ බව පැහැදිලිය. වංශකථාවන්හි දැක්වෙන අන්දමට ආරාමික වංසකථා තම ආරාමයන් වෙනුවෙන් මෙම යුගයේ දී ලියා ඇත. මේ අනුව සෑම ආරාමික ආයතනයකම පුංචි හෝ පුස්තකාලයක් තිබූ බවට අනුමාන කළ හැකි අතර තන්තිරිමලේ ගල්තලාවේ ශේෂව දැකිය හැකි පුස්තකාල ගොඩනැඟිල්ල මේ සඳහා නිදසුන්ය.[21] මේ අනුව ආරාමික ආයතනයන්හි කුඩා පුස්තකාල ද, පාරිවෙණස්ථානයන්හි මධ්‍යම පුස්තකාලයන් ද, මූලාස්ථානයන්හි විශාල පුස්තකායන් ද වූ බව පැහැදිලි වේ.

## මාතලේ අලුවිහාරයේ දී ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම

ක්‍රි. පූ 1 වන සියවසෙහි වළගම්බා රජු දවස මාතලේ අලුවිහාරයේ දී ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම ලංකා ඉතිහාසයේ මෙන්ම පුස්කාල ඉතිහාසයේ ද ඉතා වැදගත් සිදු වීමකි. වළගම්බා රජ දවස මෙරට පැවති දේශපාලන අස්ථාවරත්වය නිසා මෙරට භික්ෂූන් වහන්සේලා ඉන්දියාවට පලා ගොස් ඇත. මේ නිසා ධර්මය කට පාඩමින් රැක ගෙන ආ භික්ෂූන් අඩු වූ නිසා ත්‍රිපිටකය මාතලේ අලු විහාරයේදී ග්‍රන්ථාරූඪ කිරීමට සිදුවිය. මීට බලපෑ කරුණු කිහිපයක් අදිකාරම් විසින් මෙසේ දක්වා ඇත[22].

01. දිවයින නිතරම පාහේ අබෞද්ධ පර සතුරු ආක්‍රමණවලට ගොදුරුවීම නිසා ආගමික අධ්‍යාපන මධ්‍යස්ථාන අත්හැර යන්නට භික්ෂූන්ට සිදුවීම.

02. දොළොස් වසක් තිස්සේ පැවැති බැමිණිතියා සාගතය නිසා ධර්මය වාචනා මාර්ගයෙන් රැක ගැනීමේ අපහසුව ප්‍රත්‍යක්ෂ වීම.

03. දුශ්ශීලයින් ශාසනගත වීම නිසා ධර්මය නිර්මලව ආරක්ෂා කරගෙන ඒමට තිබූ උදේ‍යාගය හීන වීම.

04. මහාවිහාරයෙන් වෙන්වුණු පක්ෂයක් අභයගිරියෙන් බිහිවීම.



මහාවංශයෙහි හා දීපවංශයෙහි දැක්වෙන අන්දමට බැමිණිතියා සාගතය නිසාත්, පෙර සඳහන් කළ නිකාය භේදය නිසාත් දහමෙහි අනාගත සුරක්ෂාව උදෙසා "පණ්ඩිත භික්ෂූහු අනාගතයෙහි පණ්ඩිත බහුශ්‍රැතයන්ගේ අභාවය දැක"[23] මෙතෙක් කටපාඩමෙන් ආරක්ෂා කර ගෙන පවත්වාගෙන පැමිණි ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම සඳහා යොමු බවක් දක්වා ඇත. මෙසේ ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ වීමත් සමගම ථෙරවාදී බුදුදහම පිළිබඳ අටුවා, ටීකා වැනි බොහෝ කෘති මහාවිහාරිකයන්ද, අභයගිරිකයන් මහායානික බුදුදහමට අනුව යමින් විමුක්තිමාර්ගය වැනි ග්‍රන්ථ ද රචනා කරන්නට වූහ. මෙලෙසින් මහාවිහාරය, අභයගිරිය, ජේතවනය කේන්ද්‍ර කරගනිමින් විශාල වශයෙන් ග්‍රන්ථ රචනා වීමෙන් ඒවායෙහි පොත්ගුල් පොත් පත්වලින් පිරී යන්නට විය. එසේම මෙරට හා විදේශීය බොහෝ පොත්ගුල්වල තැන්පත් කරන ලද්දේ මෙසේ ග්‍රන්ථාරූඪ කරන ලද පොත්වල පිටපත්ය.

අනුරාධපුර යුගයෙහි ක්‍රිඃ ව හයවන සියවසෙහි රාජ්‍ය පාලනය කළ 1 වන අග්ගබෝධි රජු (ක්‍රි. ව 575 - 608) දවස සිටි කවීන් සොළොස් දෙනෙකු පිළිබඳ තොරතුරු මහාවංශය, නිකාය සංග්‍රහය, රාජාවලිය, පූජාවලිය හා දළාදා සිරිතෙහි සඳහන්ය. නිකාය සංග්‍රහයේ[24] දැක්වෙන අන්දමට කවීන් දොළොස් දෙනාගේ නම් මෙසේය.

සක්දාමල

අසක්දාමල

දෑඩි,

බැමිණි

දළබිසෝ

අනුරුද් කුමරු

දළගෙන් කුමරු

කිත්සිරි කුමරු

පුරවඩු කුමරු

සූරියභානු

කසුප්කොට ඈපා

යනුවෙන් දොළොස් මහකවීන්ගේ නම් එහි සඳහන්ව ඇත. මහාවංශයෙහි "කවියෝ සිංහල නිරුක්තියෙන් විසිතුරු නයින් යුක්ත කවි ගෙතූහ"[25] යනුවෙන් දක්වා ඇති අතර මොවුන් විසින් බොහෝ කාව්‍ය නිර්මාණ සිදු කළ බවට අනුමාන කළ හැකිය. දැනට මොවුන් විසින් රචනා කරන ලද කෘති අවිද්‍යමාන වන නමුත් සියබස්ලකර, සිදත් සඟරාව හා එළුසඳස් ලකුණෙහි එම කෘතිවලින් ගත් නිදසුන් පාඨ දක්නට ඇත. මෙහි දී සිඳත් සඟරා කතෘවරයා "තමා වදනය පොමින් - නො ඉකතැයි හැංගේ" යනුවෙන් බින්දුව පිළිබඳ ව්‍යවහාරය දැක්වීමට අසක් දා කවෙන් ගත් බව සිඳත් සඟරා පුරාණ සන්නසෙහි දැක්වේ.[26] මේ අනුව ශාස්ත්‍ර අධ්‍යයනය සඳහා දොළොස් මහා කවීන්ගේ කෘති ද පුරාණ පොත් ගුල්හි වූ බව පෙනේ.

තවද අනුරාධපුර යුගයේ දියුණු ලේඛන කලාවක ලක්ෂණ සීගිරි ගී වලින් දැකිය හැකි අතර ක්‍රි. ව අට, නමය



සියවස්වල ජීවත් වූ ලාංකීය සංචාරකයන්ගේ අව්‍යාජ අදහස් එම ගීතයන්ගේ අන්තර්ගත වේ. සීගිරි ගී ලියූවන් අතර පොත් භාරකාරයන් වූ බවක් පෙනේ.

පොත {ෙ}දවු ගී

සිව යි සිව්පත තෙපුල රහස බෙලුම් නැත්තන්

ගෙහෙනි ගයෙ ත කෙ නම් බෙයදහි අදහගත

සිටුවයි[27]

ඉහත සඳහන් සීගිරි ගීයට අනුව පොත් භාරකාර දෙවු නැමැත්තා විසින් මෙම ගීය ලියා ඇති අතර මෙයින් පැහැදිලි වන්නේ පුස්තකාලයාධිපති වෘත්තීය මෙකල සමාජ සම්මතව තිබූ බවයි.

අනුරාධපුර යුගයේ දී ග්‍රන්ථ සඳහා පූජා විධි සිද්ධ කළ බවක් මහාවංශයේ දැක්වේ. සිලාකාල රජු දවස දඹදිවෙන් ගෙන එන ලද ධම්ම ධාතුව නම් ග්‍රන්ථය මාළිගය අසල තැන්පත් කොට පූජා විධි කළ බව සඳහන් වේ.[28] තව ද V කාශ්‍යප රජු (ක්‍රි.ව 914- 923) ධම්මසංගණි ප්‍රකරණය රන්පත්වල ලියවා නගර මධ්‍යයේ ධම්මසංගණී නම් විශේෂ මන්දිරයක තැන්පත් කර පුද සත්කාර කළ බවක් දැක්වේ.[29] මේ අනුව රජවරුන් විසින් සිදු කරන ලද පුද සත්කාර ද ලේඛනයේ දියුණුවට හේතු වූ අතර එමගින් පුස්තකාල පද්ධතිය වඩාත් සංවර්ධිත ස්වභාවයට පත්විය.

අනුරාධපුර යුගයේ දී දීපවංසය, මහාවංසය, සිංහල මහාබෝධි වංසය, පාළිබෝධි වංසය, සිංහල හා පාලි ථූපවංස, සිංහළ දළදා වංසය ආදී වංසකථාවන්ගෙන් ද, සීහලට්ඨකතා හා පාලි අට්ඨකතාවන්ගෙන් ද, කච්චායන ව්‍යාකරණය ද, පියුම් ලකුණ හා සියබස්ලකර යන ඡන්දස් ශාස්ත්‍ර ග්‍රන්ථත්, කුමාරදාසගේ ජානකීහරණය, කවි චක්‍රවර්ති භදන්ත ආනන්ද හිමිගේ සද්ධම්මෝපායනය ආදී කාව්‍යත්, ධම්පියා අටුවා ගැටපදය, වංසත්ථප්පකාසිනි ආදී ටීකා, ගැටපද, සන්න යන ව්‍යාඛ්‍යාන ග්‍රන්ථත්, බුද්ධදාස රජුගේ සාරාර්ථ සංග්‍රහ නම් වෛද්‍ය ග්‍රන්ථය ද, සිඛවළඳ හා සිඛවළඳ විනිස යන විනය ග්‍රන්ථ ද , II වන දප්පුල රජුගේ ග්‍රන්ථාරූඪ කරන ලද නීතින් හා අනුවාද ග්‍රන්ථයන් රචනා වූ අතර මෙකී කෘතිවලින් ඉහත දක්වා ඇති ආරාමික පොත්ගුල් පිරී තිබී ඇත.[30]

## අනුරාධපුර යුගයේ පොත්ගුල් සම්ප්‍රදායේ සංවර්ධනයට රජවරු දක් වූ අනුග්‍රහය

අනුරාධපුර යුගයේ රජ කළ රජවරුන් අතුරින් බොහෝ ප්‍රමාණයක් පරිවෙණස්ථාන ඉදි කිරීමෙන් ද, පොත් තැන්පත් කිරීම සඳහා පොත් ගුල් ඉදිකිරීමෙන් ද, ග්‍රන්ථකරණයෙන් හා ලේඛකයන් සඳහා අනුග්‍රහ දැක්වීමෙන් ද පොත් ගුල් සම්ප්‍රදායේ ප්‍රගමනයට තම දායකත්වය ලබා දී ඇත. මේ ඒ පිළිබඳ සංක්ෂිප්ත පෙළගැස්වීමකි.



- දුටු ගැමුණු රජතුමා බොහෝ ධර්ම ශාලාවන්හි බණ පොත් තැන් පත් කොට තබා ඇත.[31] බණ පොත් ධර්ම ශාලාවන්හි තැන්පත් කිරීමට නම් ලේඛන ගත වීම අත්‍යාවශ්‍යය. දුටු ගැමුණු රජතුමා විසින් තමන් කළ පිංකම් පිංපොතක ලිය වූ බව ද මරණාසන්න මොහොතේ දී ලියන්නා විසින් එය කියවා ඇති බවත් පූජාවලියෙහි සඳහන් වේ.[32]

- ධාතුසේන (ක්‍රි. ව. 459 - 477) රජු විසින් ත්‍රිපිටකය ලිය වූ බවක් මහාවංශයේ දැක්වෙන අතර එකී ක්‍රියාව නිසා ධර්මාශෝක රජු හා සමාන කොට දක්වා ඇත.[33]

- තව ද i වන කාශ්‍යප රජු ද පොත් ලියා[34] ඇති බවක් මහා වංශයේ දැක්වෙන අතර ඒවා ත්‍රිපිටකය විය හැකි බව පැරණි ලංකාවේ පොත් ගුල් සම්ප්‍රදාය නැමැති කෘතියෙහි සඳහන්ව ඇත.[35]

- මීට අමතරව ii වන කාශ්‍යප, ii වන සේන, v වන කාශ්‍යප, iv වන මහින්ද යන රජවරු විසින් ත්‍රිපිටකය ප්‍රධාන ධර්ම කරුණු රන්පත්වල හා තල්පත්වල ලියා ඇති බව මහාවංශයෙහි දැක්වේ. තව ද බුද්ධදාස රජු සාරාර්ථ සංග්‍රහය ද, කුමාරදාස (ක්‍රි.ව 512 - 520) ජානකීහරණය ද, 1 වන සේන (ක්‍රි.ව 833 - 853) රජු

සියබස්කලර ද, V වන කාශ්‍යප (ක්‍රි.ව 914- 923) ධම්පියා අටුවා ගැටපදය ද කළ බවක් මහා වංශයෙහි දක්වෙන අතර මෙකී ග්‍රන්ථකරණය සඳහා මූලාශ්‍ර ග්‍රන්ථ අත්‍යාවශ්‍ය වන අතරම රචනා වූ කෘති තැන්පත් කිරීමට හා ලේඛන පරිශීලනය සඳහා රාජකීය හා ආරාමික පොත්ගුල ස්ථාපනය කළ අතර ඒවා රාජකීය පොත්ගුල් ලෙස හැඳින්විය හැකිය.

- අනුරාධපුර යුගයේ දී පුස්තකාල තැනීමක් පිළිබඳ රජාවලියෙහි තොරතුරු සඳහන් වේ. එහි "මහදැළියාතිස්ස රජ පන්සියයක් රහතුන් වඩා හිඳුවා පොත් සඟලක් කරවා තබා..."[36] යනුවෙන් දක්වා ඇති
- අතර "පොත් සඟල" යන්නෙහි අර්ථය පොත්ගුල යන්නයි.

මේ අනුව අනුරාධපුර යුගයේ දී බොහෝ රජවරුන් විසින් ලේඛනයට හා පොත්ගුල් තැනවීමට තම දායකත්වය දක්වා ඇති අතර එමගින් පුස්තකාල සම්ප්‍රදායෙහි ඉමහත් දියුණුවක් දැක ගත හැකිය.

## පොත්ගුල් සම්ප්‍රදායේ පරිහානික අවස්ථා

නිකාය භේදය නිසාත්, වළගම්බා වැනි රජවරුන් මහාවිහාර මත ප්‍රතික්ෂේප කළ නිසාත්, මහා විහාරයේ තිබූ



පොත්ගුල විනාශ වූ අතර ඇතැම් විදෙස් ආක්‍රමණ නිසාවෙන් මෙම ආයතනට අනුබද්ධ පොත්ගුල් විනාශ වූ බව ඉතිහාසගත තොරතුරුවල දක්වේ.

- වොහාරිකතිස්ස (ක්‍රි.ව 214 - 236) රජ දවස අභයගිරිකයන් මහායානික බුදු දහමේ කොටස් වූ වෛතුල්‍ය පිටකය සත්‍ය බුදුදහම ලෙස ප්‍රකාශ කල අතර[37] මහාවිහාරිකයන් එයට දැඩිව විරුද්ධ වූහ. මෙම ගැටුම සංසිඳුවීමට කපිල නම් බහුශ්‍රැත ඇමතියෙකු රජු විසින් පත් කළ අතර කරුණු විමසා බැලූ හෙතම වෛතුල්‍යපිටකය සත්‍ය බුදුදහම නොවන බවට තීරණය කළේය. පසුව රජුගේ නියෝගයෙන් වෛතුල්‍ය පිටකය ගිනිබත් කරන ලදි.[38]

- ගොඨාභය (ක්‍රි.ව 253 - 266) රජු දවස නැවත ද අභයගිරිකයන් වෛතුල්‍ය පිටකය සත්‍ය බුදුදහම ලෙස ප්‍රකාශ කළ අතර පඤ්ච මහා අවාසයන්හි භික්ෂූන්ගෙන් කරුණු විමසූ ගොඨාභය රජතුමා විසින් එම භික්ෂූන්ගේ තීරණය අනුව වෛතුල්‍යවාදය ඇතුළත් ග්‍රන්ථ අළුකර දැමූ අතර එකී භික්ෂූන් ද වෙර ලකුණ තබා මෙරටින් පිටුවහල් කරන ලදි.[39]
- මහසෙන් (ක්‍රි. ව 276 - 303) රජු සමයේ දී මෙරට පැමිණි සංඝමිත්‍ර නමැති මහායානික

චෝළ භික්ෂුව මහසෙන් රජ තම යටතට ගෙන වෛතුල්‍යපිටකය සත්‍ය බුදුදහම ලෙස එත්තු ගන්වා මහාවිහාරයෙහි වූ ථෙරවාදී ග්‍රන්ථ ගිනිබත් කර වූ අතර මහාවිහාරිකයන් බොහෝ හානි පැමිණ වූහ.[40] පසුව මේඝවර්ණාභය ඇමැති රජුට එරෙහිව යුද්ධ ප්‍රකාශ කළ අතර කරුණු තේරුම්ගත් රජු මහාවිහාරය නැවත ගොඩනැංවීය. රජුගේ බිසව වෛතුල්‍යවාදී පොත් විනාශ කර දැමීමට කටයුතු කළ බවක් මහාවංශයේ දක්වේ.[41] ජේතවනාරාම භූමියෙන් හමු වූ සෙල්ලිපිකඩින් මහාවිහාරික පක්ෂ්ව මහා ආවාසයන්හි වෛතුල්‍යවාදී ධර්මය අන්තර්ගත පොත් තැන්පත් කළ බව සඳහන්ය.[42]

මෙසේ අනුරාධපුර යුගයේ දී නිකාය භේදය හා රජවරුන්ගේ අදූරදර්ශී ක්‍රියාමාර්ග නිසා මහාවිහාරිකයන්ගේ මෙන්ම අභයගිරිකයන්ගේ ද බොහෝ ග්‍රන්ථ ප්‍රමාණයක් විනාශ වූ අතර මෙයින් පුස්තකාල සම්ප්‍රදායට විශාල හානියක් ඇති විය. මීට අමතරව ඉහතින් දක් වූ පරිදි විදේශ ආක්‍රමණ, දුර්වල පාලකයන් රාජ්‍යත්වයට පත්වීම, කැරලි කෝලාහල නිසා ලේඛනයට මහත් බලපෑමක් එල්ල වූ අතර බොහෝ පොත් ගුල් ද විනාශ විය.



## සාරාංශය

අනුරාධපුර යුගයේ පොත් ගුල් ඉතිහාසයේ වැදගත් සිදුවීම් මෙසේ සාංරශව දක්විය හැකිය. මහින්දාගමනයත් සමගම අක්ෂර කලාවක් ලැබීම, ලෙන් පූජා කිරීම්, ලිපි ගණුදෙනු, ආරාමික අධ්‍යාපනික මධ්‍යස්ථාන (පරිවෙණස්ථාන) ඇතිවීම, විවිධ ලේඛන මාධ්‍යයන් භාවිත කරමින් ලේඛනයන් රචනා කිරීම, ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම, විදේශීය පඬිවරුන්ගේ හෙළටුවා පරිවර්තනය කරමින් අටුවා ග්‍රන්ථ රචනා කිරීම, දොළොස් මහා කවීන්, සීගිරි ගී, ධර්ම ග්‍රන්ථයන් පූජනීයත්වයෙහිලා සැලකීම වැනි වැදගත් සිදුවීම් දක්විය හැකි අතර මෙකී සිදුවීම් ලේඛනයේ මෙන්ම ලාංකීය පොත් ගුල් කලාවේ ප්‍රගමනය සඳහා හේතු වූ බව සඳහන් කළ හැකිය.

## ආන්තික සටහන්

1. මහාවංශය, (1995), පරි. හික්කඩුවේ සුමංගල හිමි, කොළඹ, ගොඩගේ. පරි 22 : ගාථා 15
2. ඌන පූරණ සහිතො මහාවංසො (1995), ( සංස්.) පොල්වත්තේ බුද්ධදත්ත හිමි, කොළඹ, ගුණසේන. පි. 115
3. දීප වංශය (1959), අනු. කිරිඇල්ලේ ඤාණවිමල හිමි, කොළඹ, ගුණසේන. පරි 12 ගාථා 38- 40
4. ෆාහියන්, පි.116
5. දීප. පරි 18 ගාථා 14
6. ඌන පූරණ සහිතො මහාවංසො (1995), (සංස්.) පොල්වත්තේ බුද්ධදත්ත හිමි, කොළඹ, ගුණසේන. පි. 488
7. අදිකාරම්, ඊ. ඩබ්ලිව් (1963), පැරණි ලක්දිව බෞද්ධ ඉතිහාසය, ජේ. කේ. ජයවර්ධන සහ සමාගම, කොළඹ. පි. 41-42320
8. රණසිංහ, පියදාස, පුරාණ ලංකාවේ පුස්තකාලය, අප්‍රකාශිත ලිපියක්. පි. 3
9. අදිකාරම්, ඊ. ඩබ්ලිව් (1963), පැරණි ලක්දිව බෞද්ධ ඉතිහාසය, ජේ. කේ. ජයවර්ධන සහ සමාගම, කොළඹ. පි. 19-21
10. එම. පි. 19 21
11. රණසිංහ, ආර්. ඩී. අයි. එස් (2006), පැරණි ලංකාවේ පොත් ගුල් සම්ප්‍රදාය, මහරගම, තරංජී ප්‍රින්ටර්ස්. පි. 82
12. ෆාහියන්, පි. iii
13. පියරතන හිමි, ලැගුම්දෙණියේ (2014), "ශ්‍රී ලංකාවේ ආරාමික පුස්තකාල ඉතිහාසය" ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පියදාස රණසිංහ අභිනන්දන ග්‍රන්ථය, (සංස්.) ලැගම්දෙණියේ පියරතන හිමි, ඩබ්ලිව්. ජ්. වීරසූරිය සහ ආර්. ඩී. ආනන්ද තිස්ස කුමාර,පියදාස රණසිංහ පදනම, රාගම. පි. 106
14. සිංහල විශ්වකෝෂය (1) කාණ්ඩය (1963), සංස්. ඩී. ඊ හෙට්ටිආරච්චි, කොළඹ, සංස්කෘතික දෙපාර්තුමෙන්තුව. පි 67



15. රණසිංහ, ආර්. ඩී. අයි. එස් (2006), පැරණි ලංකාවේ පොත් ගුල් සම්ප්‍රදාය, මහරගම, තරංජී ප්‍රින්ටර්ස්. පි. 108
16. එම. පි. 114- 115
17. පියරතන හිමි, ලැගුම්දෙණියේ (2014), "ශ්‍රී ලංකාවේ ආරාමික පුස්තකාල ඉතිහාසය" ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පියදාස රණසිංහ අභිනන්දන ග්‍රන්ථය, (සංස්.) ලැගම්දෙණියේ පියරතන හිමි, ඩබ්ලිව්. ජ්. වීරසූරිය සහ ආර්. ඩී. ආනන්ද තිස්ස කුමාර,පියදාස රණසිංහ පදනම, රාගම. පි. 107
18. Epigraphiya Zeilanica (1912- 1966) , I, p. 41
19. Ibid , I, p. 71
20. අදිකාරි, අබයරත්න (2002), "සම්භාව්‍ය භික්ෂු අධ්‍යාපනය හා අධ්‍යාපන නීති", ගොඩගේ, කොළඹ. පි. 6
21. රණසිංහ, ආර්. ඩී. අයි. එස් (2006), පැරණි ලංකාවේ පොත් ගුල් සම්ප්‍රදාය, මහරගම, තරංජී ප්‍රින්ටර්ස්. පි. 114- 115
22. අදිකාරි, අබයරත්න (2002), "සම්භාව්‍ය භික්ෂු අධ්‍යාපනය හා අධ්‍යාපන නීති", ගොඩගේ, කොළඹ. පි. 6
23. දීවං. පරි 20 ගාථා 21
24. නිසං, පි. 17
25. මවං. පරි 41: ගාථා 13-14
26. සිදත් සඟරා පූරාණ සන්නය, (1971) (සංස්.), කොදාගොඩ ඥානාලෝක හිමි, පි. 7
27. ධම්මානන්ද හිමි, තලත්ලේ (1999), සිගිරිපද්‍ය, අභය ප්‍රකාශකයෝ, ගල්කිස්ස. පි. 160
28. මවං. පරි 52: ගාථා 50 – 53
29. එම. 52: 49-51

30. රණසිංහ, ආර්. ඩී. අයි. එස් (2006), පැරණි ලංකාවේ පොත් ගුල් සම්ප්‍රදාය, මහරගම, තරංජී ප්‍රින්ටර්ස්. පි. 89 -100

31. පූජා. පි 772 - 773 "එකී එකී ධර්ම ශාලාවන්හි අනැගි වූ වියනක්, ධර්මායතනයක්, ඇතිරියක්, දණ්ඩාසනයක්, බණවස්නක්, කබලියක්, විජිනිපතක්, බණපොතක් බැගින් ලවා ධර්මයට ද සත්කාර කොට..."

32. මවං. පරි 32: ගාථා 25 -26 :සිංහල ථූප වංශය, (සංස්.), ඩබ්ලිව්. ඇස්. කරුණාතිලක, 1989. පි. 192

33. එම. පරි 38: ගාථා 44- 45 "...ධර්මාශෝක රජුහු සෙයින් තුන් පිටකයෙහි ද සංග්‍රහ කළේය."

34. එම - පරි 39: ගාථා 18

35. [35] රණසිංහ, ආර්. එච්. අයි. එස් (2006), "පැරණි ලංකාවේ පොත් ගුල් සම්ප්‍රදාය ", කර්තෘ, කොළඹ. පි. 86

36. එම, පි. 43

37. නිසං. පි. 12

38. දීවං. පරි 22: ගාථා 41 ; මවං. පරි 36: ගාථා 41 ; නිසං. පි. 12

39. නිසං. පි. 12 - 13

40. මවං. පරි 37: ගාථා 5-7

41. එම. පරි 37: ගාථා 12- 25, 29 -31

42. E". vol. IV. p. 282